# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2015

## Primary Piriven Year End Term Test - 2015

3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය**
**Thripitaka Dharmaya**

කාලය ඃ පැය තුනයි
Time: Three hours

- **1 කොටසේ ප්‍රශ්න සියල්ලටමත් II , III හා IV කොටස් වලින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තවත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

**I කොටස**

**01. කෙටි පිළිතුරු සපයන්න.**

i. දේවදත්ත තෙරුන් වහන්සේ සිදුකළ ආනන්තරිය පාප කර්ම මොනවා ද?

ii. බෞද්ධයාගේ අත්පොත කුමක් ද? එයට අයත් ගාථා සංඛ්‍යාව කොපමණ ද?

iii. එකත් පසෙක හිදීමේදී වැළකිය යුතු දොස් **හතරක්** නම් කරන්න.

iv. කුණප කොට්ඨාශ කීයද? ඉන් **දෙකක්** නම් කරන්න.

v. ''දීඝං පස්ස මා රස්සං'' මෙහි අදහස ලියන්න.

vi. අභිධර්ම පිටකයට අයත් ග්‍රන්ථ **හතරක්** නම් කරන්න.

vii. ලෝකෝත්තර කුසල් සිත් (මාර්ග සිත්) **හතර** නම් කරන්න.

viii. වේදිස දේවියගේ දරුවන් දෙදෙනාගේ නම් මොනවා ද?.

ix. ආර්ය සත්‍ය **හතර** නම් කරන්න.

x. බ්‍රාහ්මණ දහමේ චතුර්වර්ණය දක්වන්න. (ලකුණු 4 x 10 = 40)

II කොටස

02. **පහත සඳහන් ගාථා 02 ක් සම්පූර්ණ කර අදහස ලියා එක් ගාථාවක නිදාන කථාව කෙටියෙන් ලියන්න.**

i දුන්නිග්ගහස්ස ලහුනො ................................

ii අචිරං වතයං කායෝ .....................................

iii යථාපි භමරො පුප්ඵං .....................................

iv න පරෙසං විලොමානි .................................... (ලකුණු 4 + 4+ 4 = 12)

03. i ''ලෝකය දවන ගිනි එකොළසකි'' ඉන් හයක් නම් කරන්න. (ලකුණු 06)

ii ගිහි ජීවිතයේ විඳින දුක ''බහු ධීතු'' සූත්‍රය ඇසුරින් පහදන්න. (ලකුණු 06)

04. i ඡත්ත මානවක පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

ii බුදුරදුන්ගේ අන්තිම අවවාදය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 08)

## III කොටස

05. i **''කතමං ච භික්ඛවෙ දුක්ඛ සමුදයං අරිය සච්චං''** ................ මෙම සූත්‍ර පාඨය සම්පූර්ණ කරන්න. (ලකුණු 04)

ii **''සම්මා වායාම''** ජීවිතය සාර්ථක කර ගැනීමට ඇසුරු කර ගන්නා ආකාරය පහදන්න. (ලකුණු 08)

06. i **''සමණා මයං මහාරාජ''** යන ගාථාව සම්පූර්ණ කර අදහස ලියන්න. (ලකුණු 04)

ii සඟමිත් තෙරණියගේ ආගමනයෙන් ලක්දිවට ලැබුණු දායාද පැහැදිලි කරන්න. (ලකුණු 08)

07. i භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක පහදන්න. (ලකුණු 06)

ii ආනාපාන සති භාවනාව වඩන අයුරු විස්තර කරන්න. (ලකුණු 06)

## IV කොටස

08. i බුද්ධ කාලයේ පැවති මහා රාජ්‍ය හතර නම් කරන්න. (ලකුණු 04)

ii සොළොස් මහා ජනපදවල පැවැති සමාජ තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 08)

09. i භික්ෂු විනයෙහි එන සේඛියා පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

ii දහම් දෙසීමේදී අනුගමනය කළයුතු පිළිවෙත් **පාදුකා වග්ගය** ඇසුරින් පහදන්න. (ලකුණු 08)

10. i පහත සඳහන් මාතෘකා අතුරින් තුනකට කෙටි සටහන් ලියන්න.

1) කාමාවචර සිත්
2) ලෝභමූල සිත්
3) රූපාවචර සිත්
4) සතර පරමාර්ථ ධර්ම
5) ලෝකෝත්තර සිත්

(ලකුණු 3 x 4 = 12)